// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2115/33 - 2019 මාර්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) වගන්තිය යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ කේ. ඒ. ජානක නයනානන්ද අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඩී. ඒ. බන්දුලසිරි නිමල් සාන්ත නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ඩී. ඒ. බන්දුලසිරි නිමල් සාන්ත හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරි,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 19 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

04 - 100

1A - G 29698 — 27 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*